සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

දෙවන වාර ඇගයීම
- 2018
**Second Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 9 | විෂයය / பாடம் / Subject: කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: 1,2 | පැය / மணித்தியாலம் / Hours: 02 |

➢ **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න**

1/. ශුද්ධ බයිබලයෙ හි සදහන් වීර නායකයින් දෙදෙනෙකු වන්නේ;
1. දෙබෝරා හා ගිඩියොන් 2. සම්සොන් හා එලීෂා 3. ගොලියත් හා ජෙප්තා 4. ජෝවාබ් හා සයිරස්

2/ දාවිත් රජතුමා කළ වරද උපමාවක් මගින් පෙන්වා දී ඔහුව යහමගට ගත් දිවැසිවරයා වන්නේ
1. එලියා ය. 2. නාතාන් ය. 3. ජෝනා ය. 4. ආමොස් ය.

3/ ජේසුස් වහන්සේ නව මෝසෙස් තුමා හා නව මෙසියානික ගුරුවරයාණන් බව දැක්වීම අරමුණු කරගත් ශුභාරංචිය වන්නේ
1. ශු. මාක් ශුභාරංචිය 2. ශු. ලූක් ශුභාරංචිය 3. ශු. මතෙව් ශුභාරංචිය 4. ශු. ජොහන් ශුභාරංචිය

4/ "සමිදුන් විශ්වාස කරන්නෝ සියොන් කන්ද මෙන් අචලය.; සදාකාලිකය." මෙම වගන්තිය ඇතුළත් ශුද්ධ බයිබලීය ග්‍රන්ථය වන්නේ
1. 1රාජාවලිය 2. ජෝෂුවා 3. හිතෝපදේශය 4. ගීතාවලිය

5/ A - දිවැසිවරයෙකි B - පූජකයෙකි C - විනිශ්වයකරුවෙකි D - සමිදුන්ගේ සේවකයෙකි
ඉහත කරුණු අධ්‍යයනය කරන්න . එයින් පැවසෙන තැනැත්තා වන්නේ
1. මෝසෙස් ය. 2. සාමුවෙල් ය. 3. ආරොන් ය. 4. ජාකොබ් ය.

6/ ජේසුස් වහන්සේගේ ඉගැන්වීම් වලදී ගීතාවලියෙහි ඇති ගීතිකා භාවිත කර ඇති අවස්ථාවන්ට නිදසුන් 2ක් වන්නේ
1. කන්ද උඩ දේශනාවේදී / බව්තීස්මය ලැබීමේදී 2. නාසරෙත් හි දේශනාවේ දී/ මුහුද මත ඇවිදීමේ දී
3 .කන්ද උඩ දේශනාවේදී/ කුරුස ගසේදී 4. ජෙරුසලමේදී / ගලීලයේදී

7/ A - සාප ලද්දෙක් වීම B - පොළොවෙන් නෙරපා දැමීම
C - වනයේ පලා කෑම D - වෙහෙස මහන්සි වී ආහාර ලබා ගැනීම
ඉහත කරුණු අධ්‍යයනය කරන්න. සහෝදර ප්‍රේමයට විරුද්ධව ක්‍රියා කළ කායින් ට ලැබුණ දඬුවම් ලෙස උත්පත්ති පොතේ සදහන් කරුණු දෙකක් වන්නේ
1. A හා C ය. 2. A හා B ය. 3. C හා D ය. 4. B හා C ය.

8/ "මා හා නුඹලා ද නුඹලා සමග සිටින සියලු ජීවමාන සතුන් ද අතර මතු සියලු පරම්පරාවන් සඳහා මා පිහිටුවන ගිවිසුම් ලකුණ මෙයයි." මෙයින් පැවසෙන සිදුවීම වන්නේ දෙවියන් වහන්සේ ....................... සමග ඇති කර ගත් ගිවිසුමයි
1 .නෝවා 2. ආදි මව්පියන් 3. ආබ්‍රහම් 4. මෝසෙස්

9/ දෙවියන් වහන්සේ තමන්වහන්සේ හා මුළු මැවිල්ල සමග ඇතිකර ගත් ගිවිසුමේ සංකේතය කුමක්ද?
1. වලාකුළු 2. දේදුන්න 3. ගිනිටැඹ 4. පර්වතය

පහත දැක්වෙන වගුව ඇසුරින් ප්‍රශ්න අංක 10 හා 11 ට පිළිතුරු සපයන්න

| | මුල් අගුණ පව් | මුල් අගුණ පව් නැතිකර ගැනීමට දියුණු කර ගත යුතු ගුණ ධර්ම |
|---|---|---|
| 1 | තණ්හාව | .............................. |
| 2 | ............................ | බැහැපත්කම |

10/ මෙම වගුවෙහි පළමු හිස්තැන සඳහා යෙදිය යුතු මුල් අගුණ පාපය වනුයේ,
1. උඩගුව 2. කෑදරය 3. අලසකම 4. ක්‍රෝධය

11/ තණ්හාව නැතිකර ගැනීමට දියුණු කර ගත යුතු ගුණධර්මය වනුයේ ,
1. ප්‍රේමය 2. ත්‍යාගවන්තකම 3.උද්යෝගය 4. ශාන්තිය

12/ "මම දෙවියන් වහන්සේට විරුද්ධ ව පව් කළෙමි.'' යනුවෙන් දාවිත් රජතුමා කළ ප්‍රකාශයෙන් පැහැදිළි වන්නේ
1. ඔහු දෙවියන් වහන්සේට බිය වූ බව ය. 2. ඔහු තම වරද පිළිගත් බව ය.
3 . ඔහු තම ජනතාවට එරෙහි වූ බවය 4. ඔහු තම වරද වටහා ගෙන මනස්ථාපනය වූ බවය.

13/ සිත් හැරීම තුළින් දේව සම්බන්ධතාවය ගොඩනගා ගත හැකි බව පෙන්වා දීමට ශුද්ධ වූ ලූක් තුමා සඳහන් කර ඇති උපමා දෙකක් වන්නේ
1. නැති වූ පුත්‍රයා හා නැති වූ කාසිය 2. නැති වූ බැටළුවා හා වපුරන්නා
3 . ධනපතියා හා ලාසරස් 4. පරිසිවරයා හා අයකැමියා

14/ "දෙවියන් වහන්සේ හම් වස්ත්‍ර සාදා ආදම් ට හා ඔහුගේ භාර්යාවට හැඳවූ සේක.'' මෙම සිදුවීම තුළින් සංකේතවත් වන්නේ,
1. පාපයේ බරපතලකම අවබෝධ වීමය. 2. ඔවුන්ගේ මානසික වියවුල් බවය.
3 . මැවිල්ල දෙවිදුන්ට සමීප බවය 4. පව්වූ මිනිසාට දේව ආදරය හා රැකවරණය ලැබීමය

පහත රූප සටහන ඇසුරින් ප්‍රශ්න අංක 15 ට පිළිතුරු සපයන්න




15 / මෙහි හිස්තැනට අදාළ පොත් කාණ්ඩය කුමක්ද?
1. ශුභාරංචි 2. ඉතිහාස පොත් 3. සංදේශ 4. අපෝස්තුලුරුන්ගේ ක්‍රියා පොත

16/ ශුද්ධ බයිබලයේ දිවැසිවර ග්‍රන්ථවලින් පළමුව සඳහන් වන පොත කුමක්ද?
1 .යෙසායා ය. 2. ජෙරමියා ය. 3. සෙකරියා 4. එසකියෙල්

17/ පැරණි ගිවිසුමේ පස්වන පොත් කාණ්ඩය වන එළිදරව් සාහිත්‍යයට අයත් එකම ග්‍රන්ථය වනුයේ
1 . ජෝවෙල් ය. 2. දානියෙල් ය. 3. නෙහෙමියා ය. 4. උපදේශකයා ය.

18/ A - අපගේ ජීවිත ශුද්ධාත්මයාණන්ගේ මන්දිරය වේ.
B - මිනිස් ජීවිත ඉතා පූජනීයය.
C - අහිංසක මිනිස් ජීවිත විනාශ කිරීමට කිසිවෙකුට අයිතියක් නැත
D - දෙවියන් වහන්සේ අප වෙත පවරා ඇති ජීවිතයේ හිමිකරුවෝ අපි වෙමු

ඉහත දැක්වෙන් වගන්ති කියවන්න. එම වගන්ති ඇසුරින් වැරදි අදහසක් දෙන අක්ෂරය වන්නේ
1 . Aය. 2. B ය. 3. C ය. 4. D ය.

19/ “ස්වර්ගීය නිවහනට සූදානම් කිරීමේ දේව ප්‍රසාද නිධාන.“ ලෙස කතෝලික සභා ධර්මෝපදේශයේ සඳහන් වන්නේ

1 . රෝගීන්ගේ ආලේපය/ පූජකවරය / මාර්ගෝපාකාර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

2. ප්‍රසාද ස්නාපනය /සමගි සන්ධානය / අභිවෘද්ධි ආලේපනය

3 . සමගි සන්ධානය/ රෝගීන්ගේ ආලේපනය / මාර්ගෝපාකාර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ

4 . රෝගීන්ගේ ආලේපය / පූජකවරය /සමගි සන්ධානය

20/ “යමෙක් මාගේ මාංශය අනුභව කරන්නේ ද , ඔහුට ......................ඇත. “ මෙහි හිස්තැනට සුදුසු පිළිතුර වන්නේ

1 . සදාතන ප්‍රේමයයි. 2 . ස්වර්ගීය සැපත 3. සදාතන ජීවනය 4. සදාකාලික ප්‍රීතිය

---

**9 ශ්‍රේණිය 2 කොටස**

- **පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමුවන ප්‍රශ්නයට හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද ,තෝරා ගන්නා අනිකුත් ප්‍රශ්නයකට ලකුණු 11 ක්ද බැගින් හිමිවේ.**

01/ “දේව ප්‍රසාද නිධාන “ යන මාතෘකාව යටතේ ඔබ විසින් කරන ලද ක්‍රියාකාරකම ඇසුරින් පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(1) අපට ජන්ම පාපයෙන් මිදීම ලබා දෙන ප්‍රසාද නිධානය කුමක්ද? (ලකුණු 2)
(2) සමගි සන්ධානයේ ප්‍රසාද නිධානයෙන් ලැබෙන වරප්‍රසාද 2ක් ලියන්න. (ලකුණු 4)
(3) රෝගීන්ගේ ආලේපය දානය කිරීමේ පිළිවෙතෙහි අනු පිළිවෙත් දෙකක් නම් කරන්න. (ලකුණු 2)
(4) රෝගීන් වෙනුවෙන් ඔබට ඉටු කළ හැකි යුතුකම් දෙකක් ලියන්න. (ලකුණු 4)
(5) දේව ප්‍රසාද නිධාන ලබා ගැනීමෙන් ඔබ ආධ්‍යාත්මික ජීවිතයට ලැබෙන වරප්‍රසාද 2ක් ලියන්න (ලකුණු 4)

02/ (1) ඉශ්‍රායෙල් රාජ්‍යය එක්සේසත් කළ රජවරුන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 2)
(2) වීර නායකයින්ගෙන් ඔබට ගත හැකි ආදර්ශ තුනක් ලියන්න (ලකුණු 3)
(3) පාසල තුළදී, ඔබට පන්ති නායකත්වය ලැබුනොත් එම වගකීම් ඉටු කරන ආකාරය කරුණු 6 කින් පැහැදිලි කරන්න (ලකුණු 6)

03/ (1) නව ගිවිසුමට අයත් සංදේශ දෙකක් නම් කරන්න (ලකුණු 2)
(2) අන් අයගේ යහපත වෙනුවෙන් ඔබට කළ හැකි කාර්යයන් තුනක් ලියන්න (ලකුණු 3)
(3) “සැබෑ මිදි වැල මම වෙමි. “ (ජොහන් 15:1) ජේසුස් වහන්සේ කළ මෙම ප්‍රකාශය අනුව අප ක්‍රියා කළ යුතු ආකාරය වගන්ති හයකින් විස්තර කරන්න (ලකුණු 6)

04/ (1) දේව වරප්‍රසාද කොටස් දෙකකි. එය නම් කරන්න (ලකුණු 2)
(2) ශුද්ධවන්ත ජීවිතයක් ගත කිරීමට ඔබට කළ හැකි කාර්යයන් තුනත් ලියන්න (ලකුණු 3)
(3) වර්තමාන සමාජය තුළ සිදුවන පාපී ක්‍රියා තුනක් නම් කර ඒවා පිටු දැකීමට ඔබට ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න. (ලකුණු 6)

05/ (1) පාපයට ලැබෙන දඬුවම් දෙක නම් කරන්න (ලකුණු 2)
(2) රෝගීන්ගේ ආලේපය මගින් ලැබෙන වරප්‍රසාද තුනක් ලියන්න (ලකුණු 3)
(3) පාපොච්චාරණය කිරීමට අමතක බව පවසන ඔබගේ මිතුරෙකුට හෝ මිතුරියකට ඒ ගැන පැහැදිලි කර දෙන ආකාරය වගන්ති හයකින් ලියන්න (ලකුණු 6)

06/ (1) පාපයට වැටුණු මිනිසාට දෙවියන් වහන්සේ දුන් පොරොන්දුව කුමක්ද? (ලකුණු 2)
(2) අපට නිවැරදි මග පෙන්වන පුද්ගල කාණ්ඩ තුනක් නම් කරන්න (ලකුණු 3)
(3) වත්මන් සමාජය තුළ වැරදි මගට යොමු වූ අයගේ සිත් හැරීම වෙනුවෙන් දෙවි පියාණන්ට යැදුමක් නිර්මාණය කර ලියන්න (ලකුණු 6)

07/ (1) ශුද්ධ වූ අගුස්තීනු තුමා තුළ ජීවිත වෙනසක් ඇති වීමට බලපෑ පුද්ගල චරිත දෙක නම් කරන්න (ලකුණු 2)
(2) දුර්පරීක්ෂා පැමිණි විට එයින් මිදීමට අප විසින් ගත යුතු ක්‍රියාමාර්ග තුනක් ලියන්න (ලකුණු 3)
(3) ජීවිතය දෙවිදුන්ගෙන් ඔබ ලද තිළිණයකි. එබැවින් ඔබගේ ජීවිතය සුරැකීම සඳහා කළ හැකි කාර්යයන් හයක් විස්තර කරන්න. (ලකුණු 6)